සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2019

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**08 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පරිගණක පද්ධතියක ප්‍රධාන සංරචකයන් වන්නේ,
(1) ආදායකය සැකසීම, ප්‍රතිධානය (2) ආදානය, ප්‍රතිධානය, ගබඩා කිරීම
(3) සැකසීම, ගබඩා කිරීම, සන්නිවේදනය (4) සැකසීම, ප්‍රතිදානය, ආවයනය

02. පරිගණකයක දත්ත තොරතුරු බවට සැකසීම සිදුකරන්නේ,
(1) UPS මගිනි. (2) සංදර්ශකය මගිනි.
(3) CPU මගිනි. (4) මූසිකය මගිනි.

03. පරිගණක යෙදවුම් මෘදුකාංගයක් වන්නේ,
(1) Widows 7 (2) linux
(3) Computer games (4) XP

04. පරිගණකය නිවැරදිව භාවිතා නොකිරීමෙන් වැලදෙන රෝගාබාධයක් වන්නේ,
(1) වෛරස් උණ (2) අක්ෂි ආබාධ (3) හෘදයාබාධ (4) පාදයේ ආබාධ

05. පළමු පරිගණක පරම්පරාවේ නිර්මාණය වූ පරිගණකයක් ලෙස නම් කළ හැක්කේ,
(1) ENIAC (2) IBM (3) CDC (4) Intel I3

06. පරිගකයේ ප්‍රධාන (ප්‍රාථමික) මතකය ලෙස හැඳින්වෙන්නේ,
(1) ROM (2) Hard Disk (3) RAM (4) CD

07 පරිගණකයේ මධ්‍යම සැකසුම් ඒකකයේ වේගය මනිනු ලබන්නේ,
(1) GB (2) MB (3) byte (4) GHZ

08 චුම්භක මාධ්‍යයේ දත්ත ගබඩා කරන (ආචනය) උපාංගයක් වන්නේ,
(1) CD (2) DVD (3) දෘඪ තැටි (4) සැනෙලි මතක

09 පරිගණකයේ නිර්මාණය කරනු ලබන විවිධ ලිපි (File) ගබඩා කිරීමට භාවිතා කළ හැක්කේ,
(1) Desk Top වේ. (2) Folder වේ.
(3) My Document වේ. (4) කාර්ය තීරුව වේ.

10 පරිගණක තිරයේ දිනය හා වේලාව දැකිය හැකි වන්නේ,
(1) කාර්ය තීරුව (Task bar )තුළ ය. (2) ප්‍රතිචක්‍රීකරණ බඳුන තුළ ය.
(3) My Document තුළ ය. (4) My Computer තුළ ය.

- ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා වන ප්‍රකාශ නිවැරදි හෝ සත්‍ය නම් (✓) ලකුණ ද, වැරදි හෝ අසත්‍ය නම් (✗) ලකුණ ද යොදන්න.

11 සංඛ්‍යා පද්ධතියක් සැම විටම 0 ආරම්භ වේ. (........)

12 RAM හි ගබඩා කරන මතකය විදුලි විසන්ධි වීමකදී විනාශ වේ. (........)

13 CD වලට වඩා වැඩි දත්ත ප්‍රමාණයක් DVD ගබඩා කළ නොහැකි ය. (........)

14 Mac යනු මෙහෙයුම් පද්ධතියකි. (........)

15 paint යනු යෙදවුම් මෘදුකාංගයක් නොවේ. (........)

16 ඊතල යතුරු මගින් විශේෂිත කාර්යයක් සිදුකරගත හැකි ය. (........)

17 මූසිකයෙන් යම්කිසි නිරූපණයක් (Icon) විවෘත කිරීමට දෙවරක් click කළයුතු වේ. (........)

18 .doc යනු පරිගණක චිත්‍ර (Paint) වලට අදාල ලිපි ගොනු දිගුවක් වේ. (........)

19 යතුරු පුවරුවේ Simple අකුරු Capital අකුරුවලට පමණක් මාරු කිරීම සඳහා Capslock යතුර on කළ යුතු ය. (........)

20 පන්ති කාමරයේ ඉගැන්වීම් කටයුතු සඳහා සමර්පණ මෘදුකාංග වඩා ඵලදායීව යොදාගත හැකි ය. (........)

- අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්න සඳහා රූප සටහන් සංකේතවලට අදාල කාර්යයන් ලියන්න.

21 Paint මෘදුකාංගයේ **A** සංකේතය නිරූපකයේ කාර්යය කුමක් ද?

22 ක්‍රමලේඛන ඇල්ගොරිතම නිර්මාණයේදී ▭ භාවිත සංකේත්යේ කාර්යය කුමක් ද?

23 වදන් සැකසුම් මෘදුකාංගයක (ms - word) **B** නිරූපකයේ Icon කාර්යය කුමක් ද?

24 

මූසිකයේ කොටස් දක්වෙන A B C කොටස් නම් කරන්න.

25 පරිගණක තිරයේ දැකිය හැකි 

මෙම සංකේතය නම් කරන්න. (ල. 10)

- අංක 26 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.
(පාද අගය, රික්තක නල, Save, Ctrl, ගැලීම් සටහන)

26 පරිගණකයේ ඇති විශේෂිත යතුරු වර්ගයකි. ...........................................................

27 සංඛ්‍යා පද්ධතියක සංඛ්‍යාංක සමූහය එම පද්ධතියේ ........................................ සමාන වේ.

28 පළමු පරම්පරාවේ භාවිතා කළ තාක්ෂණ උපාංගය ........................................ වේ.

29 ඇල්ගොරිතම නිරූපණය කළ හැකි එක් ක්‍රමයක් ලෙස ........................................ නම්කළ හැකි ය.

30 පරිගණකයෙන් සිදුකරන කාර්යයන් පසු අවශ්‍යතාවය මතට ලබා ගැනීමට ........................................
........................................ විධානය ලබාදිය යුතු ය.

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුර සපයන්න.

01 (i) පරිගණක පද්ධතියට දත්ත ආදාන හා ප්‍රතිදාන උපාංග 2 බැගින් ලියන්න.
(ii) මධ්‍යම සැකසුම් ඒකකයේ කොටස් නම් කරන්න.
(iii) පරිගණකයේ සුවිශේෂී ලක්ෂණ 3ක් නම් කරන්න.
(iv) පරිගණකයේ දත්ත ආචයන උපාංග 4 නම් කරන්න.

02 (i) වදන් සැකසුම් මෘදුකාංගයක භාවිතයන් 3 ලියන්න.
(ii) පහත සඳහන් වදන් සැකසුම් කොටස් සංස්කරණයට භාවිතා කළ වදන් සැකසුම් නිරූපකයන් නම් කරන්න.
1. අකුරු තද පැහැ කිරීම
2. සංඛ්‍යාවක බලයක් සේ දක්වීමට
3. අකුරු ඇල කිරීම
4. වචක ලැයිස්තුවක් කරුණු වශයෙන් සංකේතව දක්වීම.
5. අකුරු වර්ණක කිරීම.



A B C D E F G H

(iii) පරිගණකයේ භාවිතා වන මෘදුකාංග වර්ග කර උදා:- 1 බැගින් ලියන්න.

03 (i) පහත දක්වෙන සංඛ්‍යා පද්ධති ආශ්‍රිත වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යා පද්ධතිය | පාද අගය | පළමු සංඛ්‍යාංකය | අවසන් සංඛ්‍යාංකය |
|---|---|---|---|
| දශමය | A | 0 | B |
| C | 2 | D | 1 |
| අෂ්ඨමය | E | F | 7 |

(ii) 1345 යන සංඛ්‍යාව හා 3258 යන සංඛ්‍යා විහිදුවා ලියන්න.

04 අ. පහත දක්වෙන දශමය සංඛ්‍යා ද්වීමය සංඛ්‍යා බවට පත් කරන්න.
1. 25 2. 130 3. 7

ආ. පහත දක්වෙන ද්වීමය සංඛ්‍යා දශමය සංඛ්‍යා පද්ධතියෙන් ලියන්න.
1. $10101_2$ 2. $101_2$ 3. $11100_2$

05 (i) අන්තර්ජාලයෙන් ලබාගත හැකි ප්‍රයෝජන 3ක් ලියන්න.
(ii) අන්තර්ජාලයට ප්‍රවේශ වීමට අත්‍යවශ්‍ය මෘදුකාංගය හෝ වැඩසටහන හඳුන්වන නම කුමක් ද? ඒ සඳහා උදාහරණ 2 බැගින් ලියන්න.
(iii) ඔබ දන්නා සෙවුම්යන්ත්‍ර 2 නම් කරන්න.

## තොරතුරු සන්නිවේදන තාක්ෂණය I කොටස 8 වසර
## පළමු වාර විභාග පිළිතුරු පත්‍රය

1). ii

2). iii

3). iii

4). ii

5). i

6). iii

7). iv

8). iii

9). ii

10). i

11). ✓

12). ✓

13). ✕

14). ✓

15). ✕

16). ✓

17). ✓

18). ✕

19). ✓

20✓).

21). කලාත්මක අකුරු ලිවීම

22). ක්‍රියාවලිය

23). අකුරු තද පැහැ ගැන්වීම

24). A-වම් මූසික බොත්තම (Left mouse Butten)

B-අනුචලන රෝදය (Scroll wheel)

C- දකුණු මූසික බොත්තම (right mouse Butten)

25). recycle bin ප්‍රතිචක්‍රීකරණ බඳුන.

26). ctrl

27). පාද අගය

28). රික්තක නල

29). ගැලීම් සටහන

30). SAVE